ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 මැයි 18 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2020 අප්‍රේල්

COVID-19 වසංගතය මගින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන අංශයෙහි ඇතිවූ පසුබෑම පිළිඹිබු කරමින් 2020 අප්‍රේල් මාසයේදී නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, සමීක්ෂණය ආරම්භයේ සිට මෙතෙක් දක්නට ලැබූ අඩුම අගය වාර්තා කරන ලදී. ඒ අනුව, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව දර්ශකාංක 5.8 කින් පහළ යමින් 24.2 ක අගයක් වාර්තා කරන ලදී. මේ සඳහා, නව ඇණවුම්, නිෂ්පාදන සහ සේවා නියුක්තිය උප දර්ශක වල සිදුවූ වාර්තා ගත පහළ යාම ප්‍රධාන වශයෙන් හේතු විය.

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය | 2020 මාර්තු මාසයට සාපේක්ෂව |
|---|---|
| **24.2** | දර්ශකාංක 5.8 ක පහළ යාමකි. |

වෛරසය පැතිරීම සීමා කිරීම සඳහා දිවයින පුරා ඇඳිරි නීතිය අඛණ්ඩව පවත්වාගෙන යාම හේතුවෙන්, නිෂ්පාදන ආයතන සියල්ලම පාහේ 2020 අප්‍රේල් මාසය තුළ වසා දමා හෝ ඒවායේ සුපුරුදු ධාරිතාවෙන් යම් ප්‍රමාණයකින් පමණක් ක්‍රියාත්මකව තිබුණි. ඒ අනුව, නව ඇණවුම්, නිෂ්පාදනය, සේවා නියුක්තිය සහ මිලදී ගැනීම් උප දර්ශක කඩ ඉම් මට්ටමට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවතුණි. එක්සත් ජනපද හා යුරෝපීය රට වල COVID-19 වෛරසය වේගයෙන් ව්‍යාප්ත වීම හේතුවෙන් තම නිත්‍ය නිෂ්පාදන සඳහා එම රටවල ගැනුම්කරුවන්ගෙන් ඇණවුම් නොලැබුණු බව, රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ බොහෝ ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී. තවද, ඇතැම් අනියම්/තාවකාලික සේවකයින්ගේ සේවය අත්හිටුවීම සේවා නියුක්තිය අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. නිෂ්පාදනය සහ නව ඇණවුම් වල පහළ යාමත් සමඟම තොග මිලදී ගැනුම් ද පහළ යන ලදී.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අප්‍රේල් මාසය තුළ තවදුරටත් දීර්ඝ වීම සමස්ත දර්ශකයේ පහත වැටීම සැලකිය යුතු මට්ටමකින් පාලනය වීමට හේතු විය. සාමාන්‍යයෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලයෙහි ඉහළ යාම තුළින්, නිෂ්පාදන ක්‍රියාකාරකම්හි වර්ධනයත් සමග අමු ද්‍රව්‍ය කෙරෙහි ඇතිවන ඉල්ලුම ඉහළ යාම පිළිබිඹු කළද, අප්‍රේල් මාසයේ මෙලෙස ඇණවුමක් සැපයීමට වැඩි කාලයක් ගතවී ඇත්තේ COVID-19 වසංගතය ව්‍යාප්තිය සමග නැව් භාණ්ඩ ප්‍රවාහනයේ සහ දේශීය වශයෙන් භාණ්ඩ ප්‍රවාහනයේ සිදුවූ ප්‍රමාදයන් හේතුවෙනි.

| විචල්‍යය | මාර්තු | අප්‍රේල් | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **30.0** | **24.2** | **-** | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 18.7 | 11.1 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 5.2 | 3.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 44.8 | 29.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 12.7 | 9.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 85.8 | 86.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 7.5 කින් පහළ යමින් 2020 අප්‍රේල් මාසයේදී 39.8 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

COVID 19 වෛරසයේ අහිතකර බලපෑම හේතුවෙන් 2020 අප්‍රේල් මාසයේදී, ඉන්දියාව, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය, රුසියාව සහ චීනයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2020 මැයි 17 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමගින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

නිෂ්පාදකයින් සඳහන් කළ පරිදි, COVID-19 වසංගතය මගින් ගෝලීය සැපයුම් පද්ධතිය මෙන්ම ඉල්ලුම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති නමුත් නිෂ්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් පසුගිය මාසයට සාපේක්ෂව යම්කිසි වැඩි වීමක් පෙන්නුම් කරයි. කෙසේ වුවද, ඔවුන්ගේ ඉදිරි අපේක්ෂාවන් තවදුරටත් කඩඉම් මට්ටමට වඩා පහළ අගයක පවතී.

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 මාර්තු මාසයේ දී වාර්තා වූ දර්ශකාංක 32.0හි සිට 2020 අප්‍රේල් මාසයේ දී දර්ශකාංක 29.8 දක්වා පහළ යන ලද අතර, එය සමීක්ෂණය ආරම්භයේ සිට මෙතෙක් වාර්තා කළ අවම දර්ශක අගය වේ. COVID-19 වසංගතය පාලනය කිරීම සඳහා රට වසා දැමීමට (lockdown) ගන්නා ලද ක්‍රියාමාර්ග තවදුරටත් දීර්ඝ කිරීම හේතුවෙන් ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ සේවා නියුක්ති උපදර්ශක වැඩි වේගයකින් පහළ යෑම මේ සඳහා හේතු විය.

COVID-19 වසංගතය තුළින් සේවා අංශයට සිදු වූ පුළුල් බලපෑම පිළිබිඹු කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් උපදර්ශකය සමීක්ෂණය ආරම්භයේ සිට වාර්තා වූ අවම දර්ශක අගය වන දර්ශකාංක 8.9 දක්වා සැලකිය යුතු ලෙස පහළ යන ලදී. අභ්‍යන්තර ගමනාගමන සීමාවන් පනවා තිබුණු කාලය දීර්ඝ කිරීම සහ අන්තර්ජාතික වෙළඳාමට ඇති වූ බාධාවන් නිසා නැව් භාණ්ඩ මෙහෙයවීම් පහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපඅංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් තවදුරටත් පහළ යන ලදී. මීට අමතරව, අභ්‍යන්තර ගමනාගමන සීමාවන් පැනවීම සහ 2020 අප්‍රේල් මාසය තුළ දී විදේශ සංචාරකයන් නොපැමිණීම හේතුවෙන්, නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා උපඅංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් ද පහළ යන ලදී. අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා ඉල්ලුමක් පැවතිය ද බෙදාහැරීම් ජාලවල පැවති සීමාවන් මෙන්ම අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සඳහා වන ඉල්ලුම පහළ යෑමත් සමග ව්‍යාපාර කටයුතු සම්පූර්ණයෙන්ම නවතා දැමීමට සිදුවීම හේතුවෙන් තොග හා සිල්ලර වෙළඳ උපඅංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් ද පහළ යන ලදී.

කොන්ත්‍රාත් සහ අනියම් සේවකයන්ගේ සේවය අත්හිටුවීම; සහ නව බඳවාගැනීම් අත්හිටුවීම හේතුවෙන් සේවා අංශයෙහි සේවා නියුක්තිය අඛණ්ඩව පහළ යන ලදී.

නව ව්‍යාපාර සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් 2020 අප්‍රේල් මාසයේ දී අඩු වේගයකින් පහළ යන ලදී. කෙසේ වුවද, ජන ජීවිතය සහ ආයතනික කටයුතු යථාවත් කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් මූල්‍ය, සෞඛ්‍ය හා වෘත්තීය සේවා, තොග හා සිල්ලර වෙළඳාම සහ ප්‍රවාහන උපඅංශවල ප්‍රතිචාර දක්වන්නන් විසින් අනාගත ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ සුබවාදී අදහස් දක්වා තිබුණි.

| විචල්‍යය | මාර්තු | අප්‍රේල් | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **32.0** | **29.8** | **-** | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| | | **<u>උප දර්ශක</u>** | | |
| නව ව්‍යාපාර | 25.7 | 26.8 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 17.1 | 8.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 34.8 | 33.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 65.4 | 60.8 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 16.9 | 18.9 | + | අඩු වේගයකින් පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සමස්ත දර්ශක අගය තවදුරටත් පහළ යෑම පාලනය කිරීමට දායකවෙමින්, 2020 අප්‍රේල් මාසයේ දී නිමකිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව ඉහළ යන ලදී. සාමාන්‍යයෙන් නිමකිරීමට නියමිත කාර්යයන්හි ඉහළ යෑම මගින් පවතින මෙහෙයුම් ධාරිතාවය තුළ සපුරාගත නොහැකි ව්‍යාපාර ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරනු ලබයි. එහෙත්, 2020 අප්‍රේල් මාසයේ දී සිදු වූ ඉහළ යෑම, COVID-19 වසංගතය පාලනය කිරීමට අත්‍යවශ්‍ය නොවන සේවා සඳහා පනවනු ලැබූ සීමා දීර්ඝ කිරීම හේතුවෙන් සිදු විය.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

# 29.8

**2020 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.2කින් පහළ යාමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, COVID-19 වසංගතයෙහි බලපෑම හේතුවෙන් අඛණ්ඩව තෙවන මාසයටත් කඩඉම් මට්ටම වන 50.0ට පහළ මට්ටමක පවතිමින්, 2020 මාර්තු මාසයේ දී වාර්තා වූ සංශෝධිත දර්ශකාංක 36.8හි සිට 2020 අප්‍රේල් මාසයේ දී දර්ශකාංක 24.0 දක්වා පහළ යන ලද අතර, එම අගය සමීක්ෂණ ඉතිහාසය තුළ වාර්තා වූ අවම දර්ශක අගය වේ.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ජපානය, එක්සත් රාජධානිය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින්, එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2020 අප්‍රේල් මාසයේ දී පහළ ගිය බව පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, මැයි 17 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.